**ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය**

2020 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

2020 වර්ෂය සඳහා මතු සඳහන් භාණ්ඩ සහ සේවා සැපයීම වෙනුවෙන් ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය සමඟ ලියා පදිංචි වීමට මනාපැති රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය ව්‍යාපාර, රාජ්‍ය සංස්ථා, පිළිගත් සැපයුම්කරුවන්, දේශීය නියෝජිතයින්, නිශ්පාදකයින්, වෙළෙන්දන්, ව්‍යාපාර සංවිධාන සහ කොන්ත්‍රාත්කරුවන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

භාණ්ඩ සහ සේවා කාණ්ඩ එකකට වඩා වැඩි ගණනක ලියාපදිංචි වීමට සැපයුම්කරුවකු අපේක්ෂා කරන්නේ නම්, එම එක් එක් කාණ්ඩය සඳහා වෙන වෙනම අයදුම්පත් සකස්කර එකම කවරයක බහා එවිය යුතුය. ලියා පදිංචිය සිදු කිරීමට අපේක්ෂා කරන සෑම කාණ්ඩයක් සඳහාම එම එක් එක් කාණ්ඩය සඳහා නැවත නොගෙවන **රු 1,000/=** කතැම්පතු මුදලක් ගෙවිය යුතු වේ. අයදුම්පත සමඟ **දින 90ක** වලංගු කාලයක් සහිතව **මූල්‍යාධිකාරී, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය** යන නමට ආමන්ත්‍රණය කරන ලද බැංකු අණකරයක් ඉදිරිපත් කල යුතුය. ලියාපදිංචිය අපේක්ෂාකරන සැපයුම්කරුවන්ට www.seu.ac.lk යන විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් අවශ්‍ය තොරතුරු ලබාගත හැක.

**චෙක්පත් සහ මුදල් ඇණවුම් බාරගනු නොලැබේ.** මීට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ශේප කරනු ලැබේ. සැපයුම්කරුවන් විසින් ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ දක්වා ඇති ව්‍යාපාර කටයුත්ත සඳහා පමණක් ලියාපදිංචිය ඉල්ලා සිටිය යුතුය.

ඕනෑම අයදුපතක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ශේප කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුවේ. යම් සැපයුම්කරුවෙකු ලංසු කැඳවීම සිදුකරන ලද අනුගාමී අවස්ථාවන් තුන (03) කදී ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූවහොත් එම සැපයුම්කරුවන්ගේ නාමය 2020 වර්ෂයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නාමලේඛණයෙන් පූර්ව දැනුම්දීමකින් තොරව ඉවත් කරනු ඇත. සාමාන්‍යයෙන් භාණ්ඩ සහ සේවා සඳහා මිළ ගණන් කැඳවීම ලියා පදිංචි සැපයුම්කරුවන් වෙත සිදු කරන නමුත් අනෙකුත් තරඟකාරී අර්පණකරුවන්ගෙන් අවශ්‍ය අවස්ථාවන්හී දී මිළගණන් කැඳවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතු වේ.

2020 වර්ෂය සඳහා ලියාපදිංචි වූ සැපයුම්කරුවන් විසින් දින 45 ක ණය කාලසීමාවක් ලබාදීමට එකඟ විය යුතුය. යම් සැපයුම්කරුවකු ඉහත සඳහන් කොන්දේසිය ලියාපදිංචියෙන් පසුව හෝ කඩ කරයි නම් එවැනි සැපයුම්කරුවන් අසාදු ලේඛන ගත කරනු ලැබේ. සැපයුම්කරු එකතුකල අගයමත බදු (VAT) ගෙවීමට වගකීමැති සැපයුම්කරුවෙකු නම් අදාල එකතුකල අගය මත බදු සහතිකයේ සහතික කරන ලද පිටපතක් අයදුම්පත සමඟ එවිය යුතුය. එසේ සැපයුම්කරුවකු එකතුකල අගය මත බදු වගකීමට බැඳී නොමැති නම් ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් මෑතක දී ගත් බදු නිදහස්වීමේ සහතික පතක් අයදුම්පත සමඟ ඉදිරිපත් කල යුතුය. සියලුම අයදුම්කරුවන් විසින් අයදුම්පත්‍රය සමඟ **ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්** එවිය යුතු අතර ඉහත සඳහන් සහතිකපත් ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම්පත් ප්‍රතික්ශේප කරනු ලැබේ.

අයදුම්පත් එවන ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2020"**ලෙස සඳහන් කර **සහකාර මූල්‍යාධිකාරී, සැපයුම් අංශය, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල උද්‍යානය, ඔළුවිල් # 32360** යන ලිපිනයට **2019.12.23 දිනට හෝ ඊට pපෙර** ලැබෙන පරිදි ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය.

මේ පිලිබඳ වැඩි විස්තර විශ්වවිද්‍යාලයේ වෙබ්අඩවියට පිවිසීම මගින් ලබා ගත හැක. (www.seu.ac.lk)

**ලේඛකාධිකාරී**
**ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය,**
**විශ්වවිද්‍යාල උද්‍යානය,**
**ඔළුවිල් # 32360**